සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## පෙරදිග සංගීතය - I

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 4 | (21) 1 | (31) 2 |
| (2) 3 | (12) 1 | (22) 4 | (32) 2 |
| (3) 1 | (13) 1 | (23) 3 | (33) 4 |
| (4) 3 | (14) 1 | (24) 1 | (34) 1 |
| (5) 4 | (15) 3 | (25) 2 | (35) 4 |
| (6) 1 | (16) 4 | (26) 4 | (36) 2 |
| (7) 2 | (17) 3 | (27) 2 | (37) 4 |
| (8) 3 | (18) 4 | (28) 1 | (38) 4 |
| (9) 3 | (19) 1 | (29) 2 | (39) 1 |
| (10) 2 | (20) 2 | (30) 4 | (40) 3 |

(ලකුණු 1x40=40)

## පෙරදිග සංගීතය - II

(01) (i) නි රි ග ම් ග රි ස
(ii) භූපාලි රාගය
(iii) දීප්චන්දි තාලය
(iv) යමන්, භූපාලි
(v) ඩබ්.බී. මකුලොලුව
(vi) හෙළ ගී මග
(vii) සී. ද එස් කුලතිලක
(viii) රෝහණ බැද්දගේ
(ix) ලයනල් රංවල
(x) පණ්ඩිත් රවි ශංකර්
(xi) බටනලා
(xii) A.R. රහුමාන් (ලකුණු 1x12=12)

(02) (i) A - යමන් B - භෛරවි (ලකුණු 1x2=2)
(ii) භෛරවී / යමන් රාගයට අයත් නිර්දේශිත / වෙනත් මධ්‍යලය ගීතයක් නිවැරදිව, තාලානුකූලව ගීත, ස්වර ප්‍රස්තාර කිරීම සඳහා (ලකුණු 06)
(iii) ප්‍රස්තාර කරන ලද රාගය හැර අනෙක් නියමිත රාගයේ නිවැරදි ස්වර අභ්‍යාසයක් ආරෝහණ, අවරෝහණ වශයෙන් ගොඩ නැගීම සඳහා (ලකුණු 2x2=4)

(03) (i) ● වෘත්තීන් මත පදනම් වීම

● ඇදහිලි හා විශ්වාස මත පදනම් වීම

● විනෝදාස්වාදය හා සාමාජීය අවශ්‍යතා මත පදනම් වීම. (ලකුණු 1x3=3)

(ii) ගැමි ගී

- මෙහෙ ගී
  - ★ ගැල් ගී
  - ★ පැල් ගී
  - ★ පතල් ගී
  - ★ පාරු ගී
  - ★ බඹර ගී
  - ★ ගොයම් ගී
  - ★ නෙලුම් ගී
  - ★ කමත් ගී
- ඇදහිලි ගී (බැති ගී)
  - ★ ශාන්තිකර්ම ගී (උඩරට, පහතරට, සබරගමු)
  - ★ තුන් සරණේ ගී
- සමාජ ගී
  - ★ කෙළ ගී
  - ★ දරු නැලවිලි ගී

(ලකුණු 05)

● උදාහරණ 2 බැගින් තිබීම ප්‍රමාණවත්ය

(iii)

| ගැමි ගී | සේ ගී |
|---|---|
| ★ භාෂාව සරලයි. | ★ භාෂාව සංකීර්ණයි. |
| ★ මුඛ පරම්පරාගතව පැවත එයි. | ★ ග්‍රන්ථාරූඪව පැවත එයි. |
| ★ කතෘ අඥාතයි. | ★ කතෘ නාමිකයි. |
| ★ නාද මාලා ඒකාකාරීයි. | ★ අතිශෝක්ති වර්ණනා ඇත. |
| ★ පටු ස්වර පරාසයක නාද මාලාව විහිදී යයි. | ★ විවිධ විචිත්‍රවත් නාද මාලා ඇත. |
| ★ අව්‍යාජ ගැමි සිතුම් පැතුම් ගැබ්ව ඇත. | ★ කාව්‍යාලංකාර සහිත වර්ණනා ඇතුළත්ය. |
| ★ බොහෝ විට සිව්පද සිරිතට අනුකූලව නිර්මාණය වී ඇත. | |

ඉහත දැක්වෙන කරුණු අතරින් / වෙනත් නිවැරදි කරුණු 2 බැගින් ලියා ඇත්නම්

(ලකුණු 2x2=4)

(04) (i) ආඝාතාත්මකව ගැයෙන ගී පාද :-

★ සම්මා සම්බුදු වෙන මුනි රජුනේ

★ රැගත් සුරා පිරූ විතින්

★ දොඩම් කපාලා ඇඹුල් තනාලා

★ මනමත් කරවන දන මුළු දෙරණා

★ සඳවා සුදු වැලි පිට්තුරු

අනාඝාතාත්මකව ගැයෙන ගී පද :-

★ මලේ මලේ ඔය නාමල

★ කලුගල් තලාලයි පාරට දමන්නේ

★ දොළු කන්දේ ගල දෝ අර පෙනෙන්නේ (ලකුණු 1/2 x8=4)

(04) (ii) ආඝාතාත්මක ගී

- තාලානුකූලව ආඝාතය තැබිය හැකි වීම.
- සාමූහිකව ගායනය කළ හැකි වීම.
- ප්‍රස්තාර කළ හැකි වීම.

ආඝාතාත්මක ගී

- තාල බෙදීමක් නොමැති වීම.
- නිදහස්ව ඇද පැද ගායනා කළ හැකි වීම.
- ඒකල ගායනයට සුදුසු වීම.

ඉහත ලක්ෂණ වලින් වෙනත් නිවැරදි ලක්ෂණ දෙක බැගින් ලියා ඇත්නම් (ලකුණු 1x4=4)

(iii) ඉහත ගී අතරින් ආඝාතාත්මක ගීතයක් නිවැරදිව ප්‍රස්තාර කිරීම සඳහා (ලකුණු 4)

(05) (i) A - සිංහබාහු B - මනමේ C - කාලගෝල (ලකුණු 1 x3=3)

(ii) A -

| | | | |
|---|---|---|---|
| ව ගු s | ර s ට s | න ර s | නි s දු s |
| ද ඹ s | දි s ව s | ප ර s | සි s දු s |

B -

| | | | |
|---|---|---|---|
| ප්‍රේ s ම | යෙන් ම න | රං ජිත වේ | නන් දිත වේ |

(ලකුණු 2 x2=4)

(iii) සර්පිනාව / වයලීනය

කාලගෝල (ලකුණු 1 x2=2)

(iv) බෙම්ටො තාලය

| | | | |
|---|---|---|---|
| X | | O | |
| 1 | . 2 | 3 | 4 |
| ධින්ත | ධිනක | තින්න | ධිනක |

(ලකුණු 3)

(06) (i) තබ්ලා මුහුණත් ඇඳ අක්ෂර උපදවන කොටස් තුනක් නිවැරදිව නම් කර තිබීම සඳහා (ලකුණු 5)

(ii)

| දායාවෙන් | බායාවෙන් | දායාවේ සහ බායාවේ අක්ෂර එකතුවෙන් |
|---|---|---|
| තිං<br>ති<br>න<br>ට | කත්<br>ගෙ<br>කි | ධි<br>ධිං<br>ධා |

(ලකුණු 4)

(iii) ලාංකේය තබ්ලා වාදකයන්

විජේරත්න රණතුංග මහතා

D.R. පීරිස් මහතා

ඉන්දියානු තබ්ලා වාදකයන්

ශකීර් හුසේන්

අල්ලා රක්බා

ඉහත නම් / වෙනත් නිවැරදි ප්‍රවීණ තබ්ලා වාදකයන් දෙදෙනෙක් (එක් වර්ගයකට එක බැගින්) නම් කර තිබීම සඳහා

(ලකුණු 1 x2=2)

(07) (i) ග්‍රැමෆෝන් යුගයේ ජනප්‍රිය වූ ස්වධීන ගීත හා ගායක ගායිකාවන්

- 1937 න් පසු ග්‍රැමෆෝන් තැටි ගී සඳහා ආනන්ද සමරකෝන් සූරීන් සම්බන්ධ වීමත් සමඟ ග්‍රැමෆෝන් තැටි ගී යුගයේ ගමන් මග වෙනස් වූ බව.
- ස්වාධීන තැටි යුගය ආරම්භ වූයේ ඉන් පසුව බව.
- ඒ අනුව වංග සංගීතයේ ආභාසය ලත් ගී තනු සහ ජන නාද රටා නාද මාලාවලට එක් වීම.
- ඒවා ඇසුරෙන් හෙළ බස යොදා ස්වාධීන ගී තනු නිර්මාණකරණයට පෙළඹීම.
- එසේ ඇරඹි යුගය ස්වාධීන තැටි ගී යුගය ලෙස හැඳින්වේ.
- ඒ අනුව ග්‍රැමෆෝන් යුගයේ ජනප්‍රිය වූ ස්වාධීන ගීත ලෙස
  - ★ බැස සීතල ගඟුලේ
  - ★ ඇසේ මධුර ජීවනයේ ගීතා
  - ★ කරුණා නදියේ පැද යාමු
  - ★ එන්නද මැණිකේ මමත් දියඹටා
  - ★ අක්කෙ අක්කෙ අර බලන්නකෝ
  - ★ වරෙන් හීන් සැරේ
  - ★ ඕලු පිපිලා විල ලෙල දෙනවා
  - ★ මල් පිබිදීගෙන එන්නේ හැඳින්විය හැකිය.
- ග්‍රැමෆෝන් යුගයේ ගායක ගායිකාවන් ලෙස,
  - ★ ආනන්ද සමරකෝන් මහතා
  - ★ සුනිල් සාන්ත මහතා
  - ★ M.K. වින්සන්ට් මහතා
  - ★ A.M.U. රාජ් මහතා
  - ★ වසන්තා සන්දනායක මහත්මිය ආදීන් දැක්විය හැකිය.

(ii) කපිරිඤ්ඤා ගීත වල ස්වභාවය

- ක්‍රි.ව. 1505 මෙරටට පැමිණි කාපිරි ජනයාගෙන් ලැබුණු ගීත විශේෂයක් බව.
- ඉතා සරල ගී තනු වලින් යුක්ත වීම.
- 6/8 රිද්මය මුල් කොට ගීත නිර්මාණය වී තිබීම.
- ගී තනු ඒකාකාරී වීම.
- වේග රිද්මයට අනුව ගායනා කළ ගීත වලට නර්තනය ද ඊට මුසුකර තිබීම.
- එම නර්තනය 'බයිලා' නමින් හැඳින්වීම.
- ගැහැණු, පිරිමි දෙපක්ෂයම ගායනයට සහභාගී වීම.
- සංගීත භාණ්ඩ ලෙස, වියෝලා, බැංජෝ රබන්, ටැම්බරින්, රවික්ඤ්ඤය ආදිය යොදා ගැනිම.
- කපිරිඤ්ඤා ගීත සම්ප්‍රදාය ඇසුරු කොට සිංහල ගීත රැසක් බිහි වී තිබීම.

  උදා :- "මී වදයකි ජීවිතේ"
  "රස ආහාර කවලා"
  "මහා මෙරක් ලෙසට"
  "ලස්සනට පිපුණු වන මල්"

(iii) <u>නාදයේ ත්‍රිවිධ ගුණ</u>

- තාරතාවය - උච්චනීච භේදය (Pitch)
- විපුලතාවය - රූප භේදය (Magnitude)
- ධ්වනි ගුණය - ජාති භේදය (Timber)

  ලෙස කොටස් 3 ක් ඇති බව

- තාරතාවය
    - ★ නාදයේ උස් පහත් බව
    - ★ මෙය සිදු වන්නේ තත්පරයක් තුළ සිදු වන කම්පන සංඛ්‍යාතය අනුව වීම.
    - ★ එසේ කම්පන සංඛ්‍යාතය ඉහළ යන විට ස්වර වල හඬ ඉහළ යාම.
    - ★ ඒ අනුව 'ස' ස්වරය උත්පාදනයට අවශ්‍ය සංඛ්‍යාතය 256 ක් වීම.

| | |
|---|---|
| රි - 288 | ප - 384 |
| ග - 320 | ධ - 426 |
| ම - 340 | නි - 480 |
| | ස - 512 |

★ නාද උත්පාදකයේ දිග අඩු / වැඩි වීම, ඝණකම අඩු / වැඩි  වීම සංඛ්‍යාතය අඩු / වැඩි වීමට බලපාන බව...

- විපුලතාවය
    - ★ හඬෙහි සැර නැත්නම් නාදයෙහි අඩු වැඩි බව විපුලතාවය බව.
    - ★ තරංගයේ විස්තාරය මීට බලපාන බව.
    - ★ විස්තාරය අඩු / වැඩි වන්නේ පෙළීමේ බර අඩු/වැඩි නම් වීම.
    - ★ එනම් පෙළීම සඳහා යොදා ගන්නා ශක්තිය මත වීම.

- ධ්වනි ගුණය
    - ★ එක් එක් සංගීත භාණ්ඩයේ වෙනස වෙන් කොට, හඳුනා ගත හැකි ගුණය 'ධ්වනි ගුණය' නමින් හඳුන්වයි.
    - ★ එකම සංඛ්‍යාතයක් වුවද තරංග රටාව වෙනත් බව.
    - ★ ඒ වෙනස නිසා එකිනෙක භාණ්ඩයේ හඬ වෙන් කොට හඳුනා ගත හැකි වීම.
    - ★ භාණ්ඩයේ ප්‍රමාණය, හැඩය, නාද උත්පාදකයේ වෙනස ද ධ්වනි ගුණයට බලපාන බව...

ඉහත දැක්වෙන කරුණු තෝරාගත් මාතෘකා දෙකකට අදාළව ලියා ඇත්නම් / වෙනත් නිවැරදි කරුණු කෙටි සටහනක් ලෙස ලියා තිබීම.

(ලකුණු 2 x 6=12)